**නෙළුව ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

-------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 20 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නෙළුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 06 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.104,338 ක් වූ හඳුනා නොගත් ආදායම් ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු නොකර, බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව "දොරින් දොරට ගමින් ගමට" වැඩසටහන යටතේ කර්මාන්ත 14 ක ගිවිසුම්ගත වටිනාකම රු.12,160,578 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.10,248,412 ක් ලෙස දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය රු.1,912,166 ක් අඩුවෙන් දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගෙන තිබූ රු.45,270 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු.44,300 ක් වටිනා ලී බඩු හා උපකරණ හා රු.84,700 ක් වැයකර ඉදි කරන ලද ළමා උද්‍යානයේ මුර කුටි ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.174,270 බැගින් අඩුවෙන් දැක්විණි.

(ඈ) ඉකුත් වර්ෂයේ ව්‍යාපෘති 06 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබූ සහ වැයකර තිබූ රු.3,106,181 ක් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර හා ප්‍රාග්ධන වියදම් ලෙස දක්වා තිබීමෙන් එම ප්‍රමාණයෙන් මූලධන ආධාර හා ප්‍රාග්ධන වියදම් වැඩියෙන් දැක්විණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී පුස්තකාල සඳහා රු.81,000 ක පොත් ලැබී තිබුණ ද, රු.52,975 ක පොත් පමණක් ප්‍රාග්ධනීත කර තිබීමෙන් රු.28,025 බැගින් පුස්තකාල පොත් ගිණුම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් ශේෂය අඩුවෙන් දැක්විණි.

(ඊ) ප්‍රධාන ලෙජරයට අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම (309) රු.29,282,777 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.29,781,643 ක් ලෙස දක්වා තිබීමෙන් රු.498,866 කින් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම වැඩියෙන් දැක්විණි.

(උ) ප්‍රධාන ලෙජරයට අනුව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් (1.6) රු.1,453,416 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.1,605,868 ක් ලෙස දක්වා තිබීමෙන් රු.152,452 කින් සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් වැඩියෙන් දැක්විණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

(අ) ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.342,065 ක වෙනසක් පැවතුණි.

(ආ) ගිණුම් විෂයයන් 08 කට අදාල රු.2,268,263 ක් වූ පාලන ගිණුම් ශේෂයන් ඊට අදාළ උපයෝගී ලේඛන තුලනය කර නොතිබීම හේතුවෙන් උපයෝගී ලේඛනවල ශේෂ සමඟ සැසඳිය නොහැකි විය.

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.72,839 ක් වූ අවිනිශ්චිත ගිණුම් බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.75,904,814 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු හා සමීක්ෂණ මණ්ඩල වාර්තා, උපලේඛනය, කාල විශ්ලේෂණය සහ බැංකු ගිණුම් ශේෂ සනාථ සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.3,616,104 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.613,519 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 අක්කර බදු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.7,612 ක් වූ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 බදු කුලී

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.257,925 ක් වූ බදුකුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.35,700 ක් වූ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

#### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.129,750 ක උසාවි දඩ හා රු.1,428,458 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අධිකාරී බලය නොළත් ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව යම් තැනැත්තෙකුගෙන් ප්‍රාදේශීය සභාවකට අයවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් යෝජනා සම්මතයක් මගින් ප්‍රාදේශීය සභාවක් විසින් අත්හරිනු ලැබිය හැකි බවත්, රුපියල් පනහක් ඉක්මවන මුදලක් අත්හැර දැමීමට අදාළ යෝජනා සම්මතය අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව කළයුතු බව දක්වා ඇතත්, සභා යෝජනා සම්මතයක් නොමැතිව හා අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව නෙළුව වෙළඳ සංකීර්ණයේ උඩු මහල කඩ කාමර 03 කින් රු.8,103,028 ක බදු කුලී කපාහැර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

1988 අංක 74 දරන (සංශෝධිත) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2013 හා 2014 වර්ෂ සඳහා සභිකයන් 03 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ විගණන දිනය වූ 2015 අගෝස්තු 13 දින වනවිටත් ලබා දී නොතිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

සභාවේ සේවය කරන සේවකයින් / නිලධාරීන් 10 දෙනෙකුගෙන් (මාරු වී ගිය / විශ්‍රාම ගිය / සේවය හැර ගිය) අයකර ගතයුතු රු.28,755 ක මුදලක් අවුරුදු 02 කට වැඩි කාලයක සිට අයවීම් හිඟහිටව පැවතුණි.

## 3.4 වාහන පරිපාලනය

--------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාරව වාහන වෙනුවෙන් ලොග් සටහන් පොත් භාවිතා කර නොතිබූ අතර දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂය තුළදී ඉන්ධන ඇණවුම් මගින් රු.977,055 ක් ඉන්ධන සඳහා ගෙවීම් කර තිබුණ ද, ධාවන සටහන් පිළියෙල නොකිරීම නිසා එම ඉන්ධන වාහනවලට යෙදවූ බවටත්, ඒවා ධාවනයේ යෙදවූ බවටත් විගණනයේ දී තහවුරු කර ගත නොහැකි විය.

(ඇ) ඉන්ධන මිලදී ගැනීම් සඳහා තෙල් පිරවුම්හල විසින් බිල්පතක් ඉදිරිපත් කළයුතු වුවත්, සභාව විසින් ලංකා තෙල් පිරවුම්හල වෙත ඉදිරිපත් කර තිබූ ඉන්ධන ඇණවුම් වෙනුවෙන් බිල්පත් නිකුත් කර නොතිබිය දී ඉන්ධන වියදම් පියවා තිබුණි.

## 3.5 නිෂ්ක්‍රීය වත්කම්

------------------

වටිනාකම රු.250,000 ක් වූ අත් ට්‍රැක්ටරයක් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2008 ජනවාරි 11 දින සභාවට පරිත්‍යාග ලෙස ලබා දී තිබුණි.

2015 අගෝස්තු 01 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී මෙම රථය ධාවනයෙන් තොරව සභා භූමියේ ගාල් කර තිබූ බවත්, ධාවන තත්ත්වයෙන් තොරවීම නිසා ටයර් ද භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබූ බවත් නිරීක්ෂණය විය.

## 3.6 අවිධිමත් ගනුදෙනු

2014 වර්ෂය තුළදී සභා බලප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීම් හා සවිකිරීම් වෙනුවෙන් මුරකරුවෙකුට සහ කාර්යාල කම්කරුවෙකුට රු.159,650 ක් ද ඔවුන්ගෙන් වැටුප් වශයෙන් රු.452,985 ක් ද ගෙවා තිබුණි. මේ අනුව සභාවේ මුරකරු සහ කාර්යාල කම්කරු විසින් එකම අවස්ථාවේ සේවාවන් දෙකක් වෙනුවෙන් දීමනා ලබාගෙන තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය